<u>ජවිපෙ විසින්ම ජවිපෙ සිහිනය අවසන් කරනු ඇත</u>

**අනුන්ගේ බැංකු අයිරාවක මුදල් තමන්ගේ වියදමට ගැනීමේ නිමාව (ලංකා ඊ නිව්ස්-2008 අප්‍රේල් 22, පෙ.ව. 3.30 -ප්‍රගීත් එක්නැලිගොඩගේ කතිකාවකි-)**

ජ.වි.පෙ. උප්පත්ති කතාවේ හැටියට, 1964 දී රෝහණ විජේවීර සහෝදරයා ඇතුළු පුරෝගාමී තරුණ කණ්ඩායමක්, ශන්මුගදාසන් සහෝදරයාගේ චීන පිලෙන් න් වෙන් වුණු කාලයේ සිට ගනන් බැලුවෝතින් 2008 වන විට ජවිපෙ ට වයස අවුරුදු 44 කි. නැතහොත් 1971 අප්‍රේල් කැරැල්ලලේ සිට ගණන් බැලුවෝතින් අවුරුදු 37 කි. මෙ වර ඔවුන් සැමරුවේ 37 වන අප්‍රේල් විරු සමරුවය. මෙම කාලය තුළ එක්කෝ සන්නද්ධ කැරලි දෙකක් ජ.වි.පෙ. විසින් මෙහෙයවා ඇත. ජ.වි.පෙ. කියන හැටියට නම් අවස්ථා දෙකකදී රාජ්‍ය මර්දනයට මුහුන දී ඇත.
**ඇසිපිය හෙලනා සැනෙන්, කිරි කල දහසක් දොවා ගන්නට...**

පළමු කැරැල්ල හා දෙවන කැරැල්ල අතරතුරත් දෙවන කැරැල්ලෙන් පසුවත් මැතිවරණ වලට මුහුණ දී ඒවායින් ජය ගෙන හවුල් ආණ්ඩුද පිහිටුවා ඇත.

පළමු කැරැල්ල පළමු දින තුනේදී උත්සන්නව තිබී, සතියක්-දෙකක්-තුනක් යන විට පාලනය විය. පළමු කැරැල්ලෙන් කැරලිකාර තරුණ තරුණියන් 5,424 ක් දෙනෙක් ද දෙවන කැරැල්ලෙන් 24,000 ට ආසන්න සංඛ්‍යාවක් ද මිය ගියහ. (ජ.වි.පෙ. කියන්නේ පළමු කැරැල්ලෙන් 16,000 ක් හෝ 20,000 ක් පමණ දෙනෙකු ද දෙවැනි කැරැල්ලෙන් 60,000 ක් දෙනෙකුද ඝාතනය කළ බවය. ) පළමුවර සමාජවාදය ගොඩ නැගීමටත්, දෙවන වර ඉන්දියානු වඳුරු හමුදාව එලවීමටත් ගොස් එසේ ඔවුහු පරලොව ගියහ. පළමු කැරැල්ල මෙන් නොව දෙවැනි කැරැල්ල සාහසිකය. බිහිසුණුය. පුරා දෙවසරක් මුලුල්ලේ පැවැතින. දහස් ගණනක් රටේ සිවිල් වැසියන් හා සිවිල් නායකයන් කැරලි කරුවන් අතින් කුරිරු ලෙස ඝාතනයට ලක්විය. ඊට හිලව් වන්නට මෙන් කැරලිකරුවන් ද, ඝාතනයට ලක් විය. අන්තිමේ දී කැරලි නායකත්වයද ඝාතනය කැරිණ. රටම ලේ විලක් වී සුව නොවන කැළැල් ඇතිව කැරැල්ල අවසන් විය.

ටික කලක් ගිය පසු, පළමු කැරැල්ල ට නම් පොදු මහජන අනුකම්පාවක් ඇති විය. එ හෙත් දෙවැනි කැරැල්ල කෙරෙහි ඇති වූයේ පිළිකුල මුසු භීතියකි. පළමු කැරැල්ලේදී සමනලයන් ලෙස ගණන් ගැනුණු අය දෙවන කැරැල්ලේදී ගණන් ගැනුණේ මාරයන් ලෙසය. පළමු කැරැල්ලෙන් පසුව මෙන් නොව දෙවැනි කැරැල්ලෙන් පසුව ජ.වි.පෙ. කෙරෙහි සමාජ අනුකම්පාවක් ඇතිවන්නට හෝ ඔවුන් ගැන ජන සමාජය තුළ වූ සැකය තුනීවන්නට, වසර ගනණාවක් ම ගතවිය. එයත් සිදුවුනේ රටේ ප්‍රධාන පක්ෂ දෙකේ, දේශපාලන විරසකකම්, කුහකකම් තුළින් උපන් සියුම් අවකාශය සූක්ෂමව උපයෝගී කරගන්නට ජ.වි.පෙ. සමත් වූ නිසාය. ඒ හැරුණුකොට, ජන සමාජයේ සිතුවිලි වියන තනන ජ්‍යෙෂ්ඨ සමාජයේ ඇතැම් පුරුෂයන් හා ස්ත්‍රීන්ගේ ස්වාර්ථකාමී අමන ක්‍රියා කලාපයද ජ.වි.පෙ.ට වාසියට හිටියේය. තමන් නොනැසී, එ හෙත් අනුන් නැසී, තමන්ට වාසියක් වී, රෝදය කැරකේවායැයි සිතා, ජ.වි.පෙ. සුරතල් කිරීම ඒ අයගේ කාර්යය විය. ඉර බහින්නට ඔන්න මෙන්න කියද්දී, වැටෙන අවසන් හිරු කිරණ, රාස්සිගේ අව්ව යැයි කියති. ඒ අව්වෙන් දහසක් වී අමුණු වේලා ගන්නට රාස්සිය සමත් වන්නේ යැයි කියා සොඳුරු ජන මතකයක් අපේ රටේ ඇත. මහා පක්ෂවල ඉහල සිටින කුඩා මනසක් ඇති හෝමෝසේපියන්ස්ලාගේ ඇස් වසා, ඔවුන්ගේ පට්ටිවලින්, ඇසිපිය හෙලනා සැනෙන්, කිරි කල දහසක් දොවා ගන්නට අර රාස්සිය වී වේලා ගත්තා මෙන් ම ජ.වි.පෙ.ද සමත් විය. දොළු කන්දේ හාමුදුරුවන් ගේ පිරිත් වතුර තරම්ම පහසුවෙන් තම විප්ලවීය මිරිගු දිය විකුණා ගැනීමට ජ.වි.පෙ. සමත් විය. ඇත්තෙන්ම ජ.වි.පෙ. දෙවන කැරැල්ලෙන් පසු එය සිය ගමන සරි කර ගත්තේ, හරියටම ජාතික හෙළ උරුමය කළාක් මෙන්, අනුන්ගේ දේශපාලන බැංකු අයිරාවක මුදල් තමන්ගේ වියදමට ගැනීමෙනි. 37 වන විරු සමරුව පවත්වන විට, තම සමාජයට කිනම් යහපතක් කළා යැයි කියා සතුටු වීමට දෙයක් ජ.වි.පෙ. ට තිබේද?

පොලීසියේ සන්නද්ධ බලයත් හිතුවක්කාරකමත් වැඩිවීම, අතීතයට බලපාන පරිදි ප්‍රජාතන්ත්‍රවිරෝධී අණපනත් සම්මත කිරීමේ සම්ප්‍රදායක් තහවුරුවීම, (අ.යු.වි පනත ) 71 කැරැල්ලේ ප්‍රතිඵල ලෙස රටට ලැබිණ. දෙවන කැරැල්ලේ ලාභය ලෙස, ද්‍රෝහීන් යැයි කියා දහස් ගණන් ගැමි සිවිල් නායකයන්, වෘත්තීය සමිති නායකයන් ඝාතනය කිරීම, ඒ හේතුවෙන් සිවිල් සමාජ ක්‍රියාකාරීත්වය මුලුමනින්ම බිඳ වැටීම සහ ජනසමාජය

පාලකයින්ගේ හිතුවක්කාරකම් ඉදිරියේ නිහඬවීම, නීතිවිරෝධී අත්අඩංගුවට ගැනීම, පැහැරගෙනගොස් ඝාතනය කිරීම, සාක්ෂි අතුරුදන් කිරීම ආදී අලුත් මර්දන සම්ප්‍රදායයන් ආරම්භවීම. උසස් අධ්‍යාපනය පිරි හීම. රටේ රාත්‍රී සමාජ ජීවිතය බිඳවැටී රට අන්ධකාරයට යාම, ලැබී තිබේ. මේ අන්දමට කලින් කලට වියන ලද මායා දැල් වල, තමනුත් අන්තිමේ දී තමන් විසින් විමුක්තිය ලබා දෙනවායැයි කියන උතුම් ජනතාවත්, එකට පටලැවී සිටින සැටියක් නම් පෙනේ.

ස්වයංනාශක, නිරර්ථක කැරලි ගැසූ ඉතිහාසයේ එකම කණ්ඩායම ජ.වි.පෙ. පමණක් ම නොවේ. දේශානුරාගික සිංහලයා ට නීරස වුවත්, සෙන්පති මොනරවිල කැප්පෙටිපොල මෙන්ම ගොන්ගාලේගොඩ බණ්ඩා සහ පුරන්අප්පු යන නායකයන් මෙහෙය වූ කැරලි ද, කාලය හා අවකාශය නොදන, විනාශය උදා කරගත් ප්‍රතිගාමී කැරැලිය. ඒවා ශ්‍රී ලංකාවේ අසාර්ථක සටන් ඉතිහාසයේ නොමැකෙන මං සලකුණුය. වර්තමානයේ දේශප්‍රේමී සංස්කෘතික අවතැන්වූවන් මනෝරාජිකව, ඒ අතීතයට අමනෝඥ ලෙස පෙම් කළත්, ඒ කාලයේ ජීවත් වූ සාමාන්‍ය පොදු මිනිසාගේ ආශීර්වාදය නම් ඒ සටන්වලට ලැබුනේ නැත. ලැබෙන්නට ඓතිහාසික අවකාශයක් තිබුනේද නැත. ජන සහයෝගයක් ලැබුනේ නම් ඒ සටන් පරදින්නේත් නැත. ඒ අනුව ඒවාට ඉතිහාසයේ හිමිතැන ලැබිණ. කැරලි නායකයෝ අනාගත පරිභෝජනය සඳහා මිනිස් හිස්කබල් තුළට රිංගා ගෙන තිබේ. ජ.වි.පෙ. කැරලි ද විනාශයෙන් කෙළවර වූයේ අර පුරාණ සටන් මෙන්ම, ඒවා ද ඉතිහාසය විසින් ඉල්ලා නො සිටි සටන් නිසාය. මේ කැරලි ගැන අද පවා මහජනයා දන්නේ, වෙන කොහේ හෝ රටක සිදු වූ කැළඹිල්ලක් ගැන දන්නා තරමින්ය. ඒ තරමට ඒවා පොදු ජනතාවගෙන් දුරස්ථය. මේවා ඉවක් බවක් නැතිව සටන් කරන්නට ම ජන සමාජයක් තල්ලුකරනා අයට වැදගත්වනු ඇත.

පළමු කැරැල්ලෙන් පසු, යලිත් වරක්, කෙල්ලන් කොල්ලන් වලපල්ලට යැවෙන සන්නද්ධ කැරැල්ලක් සාමාන්‍ය ජනතාව, ජ.වි.පෙ.න් ප්‍රාර්ථනා නො කළහ. ඒ පළමු කැරැල්ලේ මතකයන් ඒ තරම්ම රුදුරු නිසාය. අත් අඩංගුවට පත් සැකකරුවන් හා සැකකාරියන්, ඉතා පහත් අන්දමට ලිංගික වධ හිංසාවන්ට පත්කොට, නින්දා සහගතව මරා දමා, නීච ලෙස මගතොටේ ප්‍රදර්ශණය කිරීම පළමු වරට ලාංකික ජනයා දුටුවේ 1971 දී ය. ඒ ජ.වි.පෙ. පළමු කැරැල්ල මර්දනය කෙරුණු වේලේය. ඉන් පසු,

එබඳු අප්‍රසන්න දසුනක් නැවත දකින්නට ජනසමාජයේ පැරණි පරපුර තුළ කැමැත්තක් නොවීය. මෙ නිසාම දෙවන කැරැල්ලෙන් ජන සමාජය මත ජ.වි.පෙ. තහවුරු කොට ගෙන තිබූ කළු පැල්ලම ශ්‍රී.ල.නි.ප.යේ ආධාරය නොවන්නට අකා මකා දැමීම පහසු නො වන්නට ඉඩ තිබුණි.

ජනතා විමුක්ති පෙරමුණ කුමන ඓතිහාසික වුවමනාවක් වෙනුවෙන් ඉපැදී, කුමන සමාජ අවකාශයක් පිරවීම සඳහා පවතින්නේද? එය භෞතික හේතුවක් මත පවතීද? නැත්නම් අභෞතික හේතුවක් කරණ කොටගෙන පවතිනවාද? මෙම ප්‍රශ්ණය, බොහෝ දෙනා පිලිතුරු සෙවූ නමුත් තවමත් තෘප්තිමත් පිලිතුරක් නො ලත් ප්‍රශ්ණයකි. ඇත්තෙන්ම ජනතා විමුක්ති පෙරමුණටවත් ඊට හරි උත්තරයක් ඇත්දැයි පෙනෙන්නේ නැත. අභෞතික හේතු මත භෞතික සිදුවීම් විය නොහැකිද? විය නොහැකි නම් උමතු ආගමික ලබ්ධීන් පවතින්නේ කෙසේද? මේවාට පිලිතුරු සෙවීම රට ගොඩ නගන්නට කැපවන අයගේ ප්‍රමුඛ කාර්යයකි.

විනිසුරු ඒ.සී අලස් මහතා සහ 71 කැරැල්ලට සහභාගිවූ අයෙකු වන රාවය පුවත් පතේ කර්තෘ වික්ටර් අයිවන් මහතා ද කැරැල්ල ගැන පසුබිම් වාර්තාවක් සහිත විචාරයක් කර ඇත. ජනතා විමුක්ති පෙරමුණේ විකල්ප ධාරාවක් ලෙස සැලකිය හැකි ජනතා සංගමයද සිය කෘති මගින් කැරැල්ල ගැන දේශපාලන අර්ථ නිරූපනයක් සපයා තිබේ. මේ හැර ඉතා අල්ප වශයෙන් ඉංගිරිසියෙන් ද තරමක් දුරට සිංහලෙන් ද 71 කැරැල්ල ගැන විචාර හා අධ්‍යයන ලිපි සොයාගත හැකිය. ඒ අතර සාහිත්‍ය රචනා ද කිහිපයක් තිබේ. ජ.වි.පෙ. කැරලිවලට පූර්ව විප්ලවීය හේතු සෙවීම හා කැරැල්ල කොතරම් මාක්ස්වාදී මූලධර්මවලට අනුකූල වූයේද කියා සෙවීම පොදුවේ එම රචනාවල අරමුණ වී තිබේ. කොයි හැටි වෙතත් ඒ රචනා කැරැල්ල ගැන වාර්තා කිරීමට හෝ කැරැල්ල හඳුනා ගැනීමට දැරූ අවංක උත්සාහයන් බව මෙහිදී කිව යුතුය.

ලංකාවේ ගැමි සමාජය උග්‍ර ඉඩම් හිඟයකින් පෙළෙන බවත්, තරුණ ජනගහනය බැරෑරුම් රැකියා වියුක්තියකින් පෙළෙන බවත්, කලක් තිස්සේ ප්‍රමාණවත් ආර්ථික සමෘද්ධියක් සිදු නොවීමෙන් හා සූරාකෑම ට ලක්වීමෙන්, පොදුවේ ජන සමාජය තුළ අසහනය වර්ධනය වී ඇති බවත්, තරුණ කැරලි කාරීත්වය ඒ තුලින් පැනනගින බවත්, අර රචනා අතර ඇති විද්වත් රචනාවල

සාරාංශය වේ. මේ නිසා ඒ ඒ ක්ෂේත්‍රවල ට සමාජ ප්‍රතිසංස්කරණ අවශ්‍ය වී ඇතැයි ඉන් ඇතැම් රචනා මගින් අවධාරණය කොට තිබිණ. එ හෙත් සමාජ ප්‍රති සංස්කරණ තුළින් විසැඳේයැයි සිතිය හැක්කේ ඓන්ද්‍රීය සමාජ ප්‍රතිවිරෝධ මිස සමාජ-මානසික ගැටළු නොවේ.

මේ අතර ජ වි පෙ නායකයා ඉදිරිපත් කළ වාර්තා ( 'අප නැගූ හඬ සදා නොමියෙනු ඇත' -රෝහණ විජේවීර සහ 'අවස්ථාවාදයද? නිර්ධන පංති ජාත්‍යන්තරවාදයද?'-රෝහණ විජේවීර ) සහ රහස් පොලීසියට ඔහු දුන් දීර්ඝ කට උත්තරය මගින් නම් කැරැල්ල ගැන කිසිවක් තේරුම් ගැනීමට එතරම් ආලෝකයක් ලැබෙන්නේ නැත. ඊට හේතු වන්නේ විජේවීර මහතා කළ රචනා වූ කලී අධිකරණයෙන් ගැලවීම අරමුණු කොටගෙන කළ ඒවා නිසාය. ඒ බව ඒවා කියවූ කෙනෙකුට සැනෙන් වැටහෙනු ඇත.

තමන් කැරැල්ලක් මෙහයෙවූයේ නැති බවත්, තම සංවිධානයට සිදු වූයේ, රජය විසින් තමන් මත මුදා හළ මර්දනයෙන් බේරීම සඳහා ක්‍රියා කිරීමට බවත් ඒ මහතා කියා ඇත. එහිදී තම ආත්මාරක්ෂාව සඳහා සන්නද්ධව සටන් කිරීමට තමන්ට සිදුවූ බවත් ඒ වාර්තාව මගින් කියැවේ. ඒ අනුව තමන් එවකට පැවැති නීතියට ගරුකළ බව හා නීතිය හෝ පැවැති ක්‍රමය වෙනස් කිරීමට ක්‍රියා කර නැති බව, විජේවීර මහතා අදහස් කළ බව පැහැදිලිවේ. මෙය තරුණ පිදෙල් කැස්ත්‍රෝ, බැටිස්ටාගේ පාලනයට අභියෝග කොට, නඩු විභාගයකට මුහුණ දුන්වේලේ, හැසිරුණු ආකාරයට වඩා ඉඳුරාම වෙනස් ආකාරයකි. ජවිපෙ ඒ කාලේ ඉහලින් අගය කළ ලතින් අමෙරිකාවේ ජෝසේ මාටි හෝ එරිත්‍රියාවේ කරුමේ වැනි නායකයන් අනුගමනය කළ පිළිවෙලට වෙනස් වූවකි. සභාපති මා ඕ සේතුං හෝ හෝ චි මිං නැත්නම් කිම් ඉල් සුං ගේ ක්‍රමය ට වෙනස් වූවකි. කොටින්ම කියනවානම්, නීතිය වලංගු වන්නේ එය පිළිගන්නා අයට පමණි යැයි කියා කියන විප්ලවීය කියමනට පටහැනි වූවකි. විජේවීර මහතා අනුගමනය කළ ක්‍රමයේ විශේෂත්වය හා විශ්මය වන්නේ, එක් අතෙකින් පවතින රාජ්‍ය යන්ත්‍රය හා එහි නීතියට එරෙහිව සටන් වැද, ආපසු එම නීතියේ හා එම රාජ්‍ය යන්ත්‍රයේම පිහිට පැතීමය. පවතින පාලන ක්‍රමය හැඳින්වූයේ දුර්දාන්ත ක්‍රමයක් ලෙසය. ඒ දුර්දාන්ත පවතින ක්‍රමය වහාම වනසා දැමිය යුතුයැයි කියා ඊට එරෙහිව මාරාන්තිකව සටන් කොට ඒ පවතින ක්‍රමයම අබමල් රේනුවක තරමින් වත් වෙනසක් නොකොට, පිළිගත්තේ කෙසේද? අර තරම් ජීවිත ගණනක් කැප

කළේ පවතින ක්‍රමය ඒ හැටියෙන්ම පිළිගැනීමටද? ඒ නරකයැයි කියා තමනුත් පිළිගත්, ඒ පවතින ක්‍රමයම වෙනස් කරන්නට හෝ, බැරිනම් ඉන් මිදෙන්නටවත් ඉල්ලාසිටින පීඩිත දෙමළ ජාතිය කරනා සටනට එරෙහිව, පවතින ක්‍රමයේ භාරකරුවන් වන ආණ්ඩුවටත් වඩා ඉහලින් ජ.වි.පෙ. හඬ නගන්නේ මන්ද? පවතින ක්‍රමයට එරෙහි සටන ගැන දෙවන කැරැල්ලෙන් පසු විජේවීර නොමැති ජවිපෙද දරන්නේ සම අදහසක් බැවින් එය හුදෙක් විජේවීරගේ ක්‍රමයක් නොව, ජනතා විමුක්ති පෙරමුණේ සමාන්‍ය ක්‍රමය ම බව පිළි ගැනීමට සිදුව තිබේ. සිල් රැකීමයි කුරියන් ඇල්ලීමයි දෙකම එකට කරන්න දන්නේ ජ.වි.පෙ.ම පමණි.

ඒ අනුව එය ක්‍රමයක් වෙනස් කිරීමට නොව, ක්‍රමයකට ඇතුලු වීමට කළ උත්සාහයක් හැටියට ද විස්තර කළ හැකිය. ක්‍රමයකට එරෙහිව හෝ එය වෙනස් කිරීමට සටන්වදින්නා, එම ක්‍රමය හෝ එහි නීතිය පිළිගන්නේ නැත. විප්ලව සංවිධානයක් සටන් වදින්නේ පවතින නීතිය ඇතුළු සමාජ සංස්ථාවම උඩු යටිකුරුකර අලුත් ක්‍රමයක් ගොඩ නැගීම සඳහාය. ජාතික නිදහස් අරගලයක් වූ ඉන්දියානු නිදහස් අරගලයේ දී පවා එහි නායකයා වූ මහත්මා ගාන්ධිතුමා, සිය අහිංසාවාදය ක්‍රියාවට නැගුවේද සිවිල් නීතිය උල්ලංඝනය කිරීම අරගලයේ සටන් උපාය හැටියට විවෘතවම යොදා ගැනීමෙන්ය. නීතිය නො පිළිගැනීම හා නීතියට ගරු නො කිරීම ඒ සටනට ජවය ලැබුණු උල්පත විය. ප්‍රචණ්ඩ මාර්ගයක් තෝරාගෙන සිටින ජාතික විමුක්ති සංවිධානයක් වන එල් ටී ටී ඊ සංවිධානය පවා ශ්‍රී ලංකාවේ රාජ්‍ය හෝ එහි නීතිය පිළි ගන්නේ නැත. ඉන් ඔවුන් පෙන්නුම් කරන්නේ ඔවුන් අර පවතින ක්‍රමය පිළි නොගන්නා බවය. අතිශය ප්‍රාථමික මිනිසෙකු වූ ප්‍රැන්සිස්කු හෙවත් පුරන් අප්පු පවා තමන් කැරැල්ලක් ඇති නොකළේ යැයි ද තමන් නීති ගරුකයැයි ද කියා කීමට තර්ක සෙව්වේ නැත. ඒ අනුව ජනතා විමුක්ති පෙරමුණ විමුක්ති සංවිධාන හා විප්ලව සංවිධාන වලින් වෙනස් ස්වරූපයක් පෙන්වයි. මෙ නිසා 71 කැරැල්ල අරබයා, එය හුදෙක් උමතු ත්‍රස්තවාදයක් පමණක් යැයි කියා සිරිමා බණ්ඩාරනායක මහත්මිය විසින් කළ හැඳින්වීම, එතරම් නපුරු නොවන බව මෙහිදී කිව යුතුය. දෙවන කැරැල්ලේදී, ජ.වි.පෙ. විසින් විජය කුමාරණතුංග මහතා ඝාතනය කළ අවස්ථාවේදී, ජේ. ආර්. ජයවර්ධන මහතා ද එම අදහස තවදුරටත් සනාථ කළේය. ඉතින් ජ.වි.පෙ. තුළ මෙබඳු ප්‍රතිවිරෝධයක් ඇත්තේ ඇයි?

ජ.වි.පෙ. හඳුනාගැන්මට වෑයම් කළ අය ඉදිරිපත් කරන අර

කරුණු තුන, එනම්, ඉඩම් හිගය, රැකියා වියුක්තිය සහ සූරාකෑම නිසා උපන් ගැමි දුප්පත්කම යන කාරණා කැරැලි පැන නැගීමට හේතුවී ඇත්නම්, 1956 විප්ලවය යැයි මහ ඉහලින් අගයන ඊනියා සමාජ පෙරලියෙන් කුමක් නම් සිදුවී තිබේද? මහාචාර්ය සරච්චන්ද්‍ර හා කිවිඳු ගුණදාස අමරසේකර කියා ඇති හැටියට 56 විප්ලවයේ දරුවන් යැයි කියා කියන මේ සෙනග ඒ ඊනියා විප්ලවයේ ම සාපයක් නොවන්නේද? 56 විප්ලවයේ පලයක් හැටියට වර්ධනය වූ ජාතික නූගත්කම, කලින් කලට මේ තරුණයන් කා හට හෝ මුලාවීම ට හේතු වී නැතැයි කියා කිව හැක්කේ කාටද?

ජනතා විමුක්ති පෙරමුණ වූ කලී, සිංහලෙන්ම පමණක් 'මාක්ස්වාදය' වැහැරූ ප්‍රථම දේශපාලන කණ්ඩායමය. එ නිසාම, 56 විප්ලවයෙන් පසු, එහි ප්‍රතිපලයක් වශයෙන් ඉංගිරිසිය නොදත්, සමාන්‍ය ප්‍රාථමික ගැමි ජනයා ට 'සමාජවාදය' සිංහලෙන් කියා දුන්නේ ජ.වි.පෙ.ය. 56 විප්ලවයේ පංච මහා බලවේගවලින්, 4 ක්ම සිටියේ ගමේය. ( සග, වෙද, ගුරු, ගොවි - අද ඒ බලවේග ඉන්නේ කොටසක් නගරවලය, කොටසක් මැද පෙරදිගය, තවත් කොටසක් ගමේ හෝ රණබිම්වලය) සටන් කොට ආණ්ඩු පෙරලා, බලය අල්ලා, සමාජවාදී දෙව් ලෝ ගමනට ඒ බලවේග 4 සම්බන්ධ කර ගන්නට ජ.වි.පෙ. සමත් විය. සත් සයුරෙන් එහා, තමන් එතෙක් අසා නො තිබූ, සමාජවාදී රාජ්‍යවල ජනයා විඳින සුර සැප ගැන කියා දී, විප්ලවය කළෝතින් තමන්ටද ඒ සැප ලබා ගත හැකියැයි කියා සිංහල ගැමි තරුණයා ගේ මස්තිස්කය තුළ විප්ලවීය බීජ තැන්පත් කිරීමට සමත් වූයේ ජ.වි.පෙ.ය. දියසේන කුමරු පැමිණ, සුර සැප ලබා දේවි යැයි කියා 56 දී රැවටුණු මවුපියන්ගේ දරුවන් 71 දී සමාජවාදී ක්ෂණික සැපට රැවටුනේ එසේය. අමා මහ නිවන ද, දෙව් මිනිස් සැප කෙළවර ලැබීමට හිත හදාගෙන සිටි ගැමියන් අතර, ජ.වි.පෙ. විසින් ගෙන ආ සුභාරංචිය, සංවර්ධන ලොතරැයිය මෙන් වේගයෙන් පැතිරයාම පුදුමයක් නොවේ. එ වැනි දේව අවතාරයක් ජන සමාජය කලක සිට බලා පොරොත්තුවෙන් සිටියේය. විශ්වාසෙටම සැපක් ලැබෙනවානම් ඒ වෙනුවෙන් ජීවිතය පරදුවට තබන්නට ඕනෑම සමාජයක දුගියන් සූදානම්ය. මැණික් දඩයක්කාරයන් වෙනුවෙන් තම ජීවිතය අනතුරුදායක පතල් රස්සාවේ යොදවන්නට ලංකාවේ ගැමි ඉලන්දාරීන් ඉදිරිපත් වන්නේ යම් සේද, ඒ සිතිවිල්ලෙන් ම විප්ලවය වෙනුවෙන්ද සංත්‍රාසකාමී සංචාරයකට ඔවුන් සූදානම්විය. නව සමාජයක් ගොඩ නැගීමට රට බාර දිය යුතු යැයි කියා ජාතික චින්තකයන් කියන්නේ ඒ අවිද්‍යාන්ධකාරයේ මෝහයෙන් සරනා සමාජ සත්වයන්ටය. එය

ඇත්තටම තරුණයන් ඇන්දවීමක් නොවේද? ලෝක යථාර්ථය තුළ තරුණයන්ට සමාජයක නායක කාර්යභාරයක් තිබේද? තිබුණේ ද?. ඉතිහාසය නිර්මාණය කොට ඇත්තේ තරුණයන්ද නැත්නම් මුහුකුරාගිය ප්‍රබුද්ධ වැඩිහිටියන්ද? ලොව නව සොයා ගැනීම් කීයක් නම් තරුණයන් සොයාගෙන ඇත්ද?. තමන් තමන්ටම රැවටී සිටින තරුණයන් ඒ ගැන මොහොතක් සිතීම නරක නැත.

71 කැරැල්ලට හේතු ගැමි දරිද්‍රතාවය යැයි නිගමනය කළත්, 1977 සිට රට ප්‍රාග්ධන නිදහස්වාදී ක්‍රමයකට හැරී, එතෙක් පැවැති ක්‍රමය වෙනස් වී, අලුත් ආදායම් මාර්ග විවෘත වී, රැකියා සැපයුම වැඩි වී, ලෝකයට විවෘත වී, ක්‍රමයෙන් ග්‍රාමීය සමෘද්ධියක් ද ඇති වී, ආදායම් මට්ටම් වර්ධනය වෙමින් තිබියදී, යලිත් වරක් ඉන්දියානු වඳුරු හමුදාව එලවීම හෝ මවුබිම පළමුව කියා හෝ අලුත් තේමාවක් සොයාගෙන, බිහිසුණු කැරැල්ලක් ඇති කළේ මන්ද? මෙය සන්නද්ධ සටනක් අවුලුවාගන්නට මොකක් හෝ පොටක එල්ලීමක් නොවේද? අවතාර මෙල්ල කිරීම සංවර්ධන ව්‍යාපෘති වලට කළ නොහැකි බවට මෙය කදිම උදාහරණයකි.

87-89 කැරැල්ලට පිළිතුරු සොයන වික්ටර් අයිවන් මහතා කියා සිටින්නේ, ශ්‍රී ලංකා සමාජය බැරෑරුම් කුළ පීඩනයකින් පෙළෙන බවයි. එම කුළ පීඩනය ජවිපෙට කැරලිකාර ඉන්ධන සපයන බව ඒ මහතා අනුමාන කරයි. එය එල්.ටී.ටී.ඊ. සංවිධානයේ පැවැත්මට ජනවාර්ගික පදනමක් තිබෙනවා මෙන් තාර්කික ඓන්ද්‍රිය සමාජ පදනමක් ජ.වි.පෙ.ට ද ඇතැයි කියා සිතීමකි. එය මාක්ස්වාදීන් හා භෞතිකවාදීන්ගේ සාධාරණ සිතුවිල්ලකි. අයිවන් මහතා මෙන්ම තවත් අය කියා සිටින මෙම කුළ පීඩනය රටේ පවතින බව ඇත්තකි, නමුත් එය ජ.වි.පෙ. කැරලිකාරිත්වයට පදනමක්මද? දුප්පත් කමත් කුළ පීඩනයත් තුරන් වුවහොත් ජ.වි.පෙ. ද තුරන් වේයැයි සිතිය හැකිද? මාගේ අදහස නම් ජ.වි.පෙ කැරලි කාරීත්වය තේරුම් ගැනීමට කුළ යථාර්ථය බලවත් මානයක් සපයන්නේ නැති බවය. මන්ද කියනවානම්, ජවිපෙ කේඩරයට කුල දූරාවලියේ සැම ශ්‍රේණියකින්ම සාමාජිකයන් ගලා ඒමත්, කැරලි කරුවන් තම ලේ ඥාතීන්ම පවා ඝාතනය කිරීමත් අර අදහසට නොගැලපෙන නිසාය.
(කැරැල්ල පීඩිත ජනයා වෙනුවෙන් පෙනී සිටි ප්‍රේමදාස ජනාධිපතිවරයාට පක්ෂ පාතී නොවීය.) ඔවුන් පුද්ගල ඝාතනවල නියැලී ඇත්තේ තම විප්ලවයේ සතුරා හෝ සතුරාගේ මිතුරා

අපගේ සතුරාය යන අර්ථයෙනි. තම කුළයේ අය මරා දැමුවේ ඒ අර්ථයෙනි. තම සංවිධානය වෙනුවෙන් කැප වී සිට ඉවත්වූවන් ද සැලකෙන්නේ ඒ සනයේම කොටසක් හැටියටය. වඩාත්ම වෛරයට පාත්‍රවන්නේ තම සංවිධානයේ ආසන්නතම සතුරා ලෙස සලකන්නේ ද එවන් ඉවත් වූ සාමාජිකයාය. බොහෝ විට මෙම ගති ලක්ෂණය සම්බන්ධ කළ හැකි වන්නේ මාෆියා වර්ගයේ සංවිධානවල රජයන සංස්කෘතියටය. නැතහොත් අන්තවාදී උමතු මූලධර්මවාදී ආගමික සංවිධානවල සංස්කෘතියටය. වෙනත් වචන වලින් කියනවානම් ජන සමාජයෙන් පරාරෝපනය වූ කල්ලිවල සංස්කෘතියටය. ඔවුහු සමාජය තමන්ගේ කොටසක් ලෙස සලකන්නේ නැත. විමල් වීරවංශ මංත්‍රීවරයා පාර්ලිමේන්තුවේදී කළ කතාවෙන්ද ඒ බව තහවුරු විය, තමන් ජ.වි.පෙ. සමග එක්වීමේ දී තම පියා විරුද්ධ වූ බවත්, තමන් සංවිධානයට එක් වී රාජකාරි කරද්දී, තම පියා ටයර් අතර දැවුනු මළ සිරුරකට එබී බලා, සිය පුතුගේ මුහුන සොයනු තමන් විසින් දුටු බවත්, (එහෙත් කෙසේ හෝ පියා මුනගැසී ඔහුගේ දුක තුනී නොකෙළ බවත්) සඳහන් කළේය. එය ගැන කෙනෙකුට සැකයක් තිබිය නොහැකිය. පරාරෝපිතයෙකුගේ ස්වභාවය එසේය. විමල් වීරවංශ මහතාද තම පියාගේ දුක තුනීකරනවාට වඩා පක්ෂයේ රහස්‍යභාවය රැකගන්නට ක්‍රියා කළ බව පැහැදිලිය. මෙය වීරවංශ මහතා සම්බන්ධයෙන් පමණක් නොව, ජ.වි.පෙ. වැඩිදෙනා හෝ සැම දෙනාම සම්බන්ධයෙන් ඇත්තකි. ජ.වි.පෙ. සැම දෙනාටම ඇත්තේ එකම කතාවකි. යෞවනය හැමදෙනාටම අහිමිවිය. ඒ අනුව ජ.විපෙ. සාමාජිකයා යනු දෙවරක් උපත ලද්දෙකු බව කිව යුතුය. ඔවුහු සමාජයෙන් වෙන්ව එහෙත් සමාජයට ඉහලින් සිහින ලොවක ජීවත් වෙති. එල්.ටී.ටී.ඊ යද මීට ඉතා සමාන ගති ලක්ෂණ පෙන්නුම් කරන නමුත් එය ජ.වි.පෙ. මෙන් නොව ඓන්ද්‍රිය පදනමකින් ශක්තිමත්ය.

ගෙයින්, දොරින් අභිනිශ්ක්‍රමණය කළ මිනිසා නැවත ගිහි ගෙය සමග යා වන්නට බලන්නේ නැත. පියාගේ කඳුළු බලන්නේ නැත. තම රැහැ දෙස බලන්නේ වීරවංශ මහතා මෙන් ම පිටස්තරයෙකු ලෙසය. සුද්ධෝදන රජතුමා බුදුන් වහන්සේ වෙත පැමිණ, ආහාර සිඟා යාමෙන්, ශාක්‍ය වංශයට අවමාන නොකරණ ලෙස ඉල්ලා සිටි වේලේ, තමන් ශාක්‍ය වංශයට අයත් නොවන්නේ යැයි උන් වහන්සේ වදාල බව ශාසන සාහිත්‍යයේ සඳහන්ය. පරාරෝපනය වීමේ ස්වභාවය එයය. පරාරෝපනය වන්නේ ගෘහයෙහි (පරිසරයෙහි) සමාජයෙහි සීමා ප්‍රමාණවත් නොවේ යන වැටහීමක්

නිසාය. වැදගත් වන්නේ ඒ වැටහීමය. ලෞකික ජීවිතයේ උපරිම සැපට එහා වෙනත් යථාර්ථයක් තිබිය යුතුයැයි වටහා ගත් පසු, සිද්ධාර්ථ කුමරු ගිහි ගෙය හැර ගියා සේම, පවතිනක්‍රමය ට එහා සොඳුරු ලොවක් ඇතැයි කියා අසා දැනගත්තාට පසු, අන්න ඒ සොඳුරු ලොව සොයා යාමට ගැමි තරුණයා ගම් දොරින් පිට මං වීමද ස්වභාවිකය. සැප සතුට සාපේක්ෂය. එය එක් එක් අයගේ ජීවන තත්ත්වය හා බැඳී තිබේ. සැමවිටම කොයි මනුෂ්‍යයාත් පාහේ තමන් විඳිමින් සිටින සැපට වැඩි සැපතක් සොයති. උසස් සැපතක් ඇතැයි කියා දැනගත් පසු සැපයැයි කියා තමන් විඳිමින් සිටින්නේ දුකක් යැයි සිතති. තමන් ජීවත් වූ පරිසරය ඉන් පසු ඉඩ මදිවේ. ලෝක ස්වභාවය එයය. සියළු කාර්මික-තාක්ෂණික සමාජ විප්ලව හටගත්තේ ඒ නිසාය. ශිෂ්ඨාචාරය මෙතෙක් පෙරට පැමිනියේ ඒ ධර්මතාවය මතය. එම නිසා යම් යම් කාල වකවානුවවලදී රටේ සංවර්ධනයක් ඇති වී ගැමි දුගීභාවය තුනීවුවත්, ඊටත් වඩා අලුත් සැපක් ලැබෙන මගක් ගැන බලාපොරොත්තුවක් ඇති වූ විට, අර ඇස් පනාපිට ඇතිවෙමින් තිබෙන දියුණුව අතහැර, අලුත් සැපක් සොයා යාම පෘතග්ජන මිනිසාගේ ස්වභාවයය. ඉතින් ජ.වි.පෙ. ඇති කළ අමුතු වැටහීම කුමක්ද? පිළිතුර, සුරසැප දෙන සමාජවාදී විප්ලවයය.

විශේෂයෙන්ම සමාජ පරාරෝපනයට වඩාත්ම නතුවන්නේ අයිවන් මහතා සහ තවත් අය කියන පීඩිත කුළ විය හැකිය. මන්ද කියනවානම් සමාජ සචලතාවය හෙවත් ප්‍රගතිය අඩුවෙන්ම සිදුවන්නේ ඔවුන් අතර නිසාය. ඉක්මන් සෙතක් ඔවුන් බලා පොරොත්තු වනවා ඇත. ඒ නිසාම වඩාත් සමාජ සැනසුමක් වෙනුවෙන් දිවි දෙන්නට කැමැත්ත ඔවුන් අතර ඇතිවිය හැකිය. සියළු යස ඉසුරු ලැබෙන උත්තරීතර සමාජවාදී බලාපොරොත්තුව ඔවුන් අතර වඩාත් ජනප්‍රිය විය හැකිය. එ හෙත් ජ.වි.පෙ. කැරලිකාරිත්වය සම්බන්ධයෙන් මූල ධර්මය වූ කලී පරාරෝපනය වීම මිස කුළ පීඩනය හෝ පංති පීඩනය නොවේ. පරාරෝපිත සංඝයක් තමන්ගෙන් බැහැර ලෝකය සමග ගනු දෙනු කරන ආකාරයත්, තම සංඝය තුළ ගනුදෙනු කරන ආකාරයත් එකිනෙකට වෙනස්ය.

විමල් වීරවංශ මංත්‍රීවරයා මුල්කොටගෙන හටගත් අර්බුදයේදී ජ.වි.පෙ. හැසිරුණේ ඒ වෙනස්කම හුවාදක්වමින්ය. විමල් වීරවංශ මංත්‍රීවරයාට පක්ෂපාතිත්වය දැක්වූ මංත්‍රී වරුන් පරිහරණය කළ වාහන සියල්ල පක්ෂ කාර්යාලය වෙත ගෙන යාමේදී ඔවුන් රටේ

නීතිය හෝ සම්ප්‍රදාය සැලකුවේ නැත. ඔවුන් සැලකුවේ ඔවුනගේ නීතියයි වීරවංශ මංත්‍රී වරයා මෙන්ම තමන් ද මහජන ඡන්දයෙන් පත්වූ මංත්‍රීවරුන්ය යන්නවත් කල්පනා කළේ නැත. ඒ සියල්ල කළේ සංසයේ හෙවත් දේශපාලන වරිග සභාවේ නීතිවලට අනුවය. ජ.වි.පෙ. ආරම්භයේ සිටම ක්‍රියාකළ සම්ප්‍රදාය එයය. දශක හතරක් තිස්සේ පෘථිවිගෝලය කෙතරම් වට ගණනක් භ්‍රමනය වී ඇතත්, ඉතිහාසයේ රිද්මය වෙනස් වී ඇතත්, ධනවාදයත් සමාජවාදයත් දෙකම අතුරුදන් වී පෘතග්ජන මිනිසුන්ගේ ගෝලීය සමාජයක් බිහි වී ඇතත්, කාලයේ හා අවකාශයේ කිසිදු නියමයක් ජවිපෙ ට බල නො පෑම පුදුමයක් නොවේ. ඒ ජ.වි.පෙ. හැටිය. ඒ එය අප ජීවත්වන යථාර්ථයෙන් පිට යථාර්ථයක ජීවත්වන දේහයක් බැවිනි. භෞතික හේතු නොමැතිව පවතින යථාර්ථයන් ඇති බවට මෙය නිදසුනකි.

වාර්ගික සන්නද්ධ ගැටුම අරබයා ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන දැක්මද මේ අයුරින්ම අභව්‍ය බව කිව යුතුය. දුර සිට බලනවිට එය ඍජු වර්ගවාදය ලෙස පෙනුනත් එහි සැබෑ තත්ත්වය ඊට වෙනස්ය. ජ.වි.පෙ. යනු ජාතික හෙළ උරුමය මෙන් හුදු වර්ගවාදී ව්‍යාපාරයක් ම නම් එයද දෙමළ ජනයා රවටා අවි උදුරාගැනීමේ අටියෙන් බලය බෙදීමේ යෝජනාවලට පක්ෂපාතීවනු ඇත. එහෙත් ජ.වි.පෙ. ඊට විරුද්ධය. හේතුව පැහැදිලිය. බලය බෙදුවෝතින් අර අනාගත සමාජවාදයත් බෙදීයනු ඇතැයි ඔවුහු සිතති. වෙනත් වචන වලින් කියනවානම්, එ හෙම කරන්නට ඉඩ දුන්නෝතින් එල් ටී ටී ඊ ය තමන්ට වඩා කෙරුමෙක් වන නිසාය. බලයට පත් වන කුමන ආණ්ඩුවකටවත් ස්ථාවර වී වැඩකර සාර්ථක වන්නට ඉඩ නො දෙන්නේත් තම සිහිනයට ඉඩක් නැතිවේයැයි සිතන නිසාය.

ශ්‍රී ලංකාවේ කුල දූරාවලියේ ඉහලින් පිහිටා ඇති කුළය සිංහළ ජනගහනයෙන් අඩකි. කුඩා පීඩිත කුළ සියල්ල දූරාවලියේ පහලින් පිහිටා තිබේ. පිරමිඩයක් යැයි කීවාට මේ පිරමිඩයේ මුදුන විශාලය. ජ.වි.පෙ. සංයුතිය බැරෑරුම් ලෙස අර පිරමීඩයට සමාන්තර බවක් නැතැයි කියා ඒ හැටියටම කියන්නට අයිවන් මහතාට කරුණු ඇත් දැයි මම නොදනිමි. එසේ තිබුනත් පීඩකයාට පීඩක ස්වභාවයෙන් ද පීඩිතයාට පීඩිත ස්වභාවයෙන් ද වෙනස් වීමට නොහැකි මෙම ගෝත්‍රික මානව ප්‍රතිරෝධය ජ.වි.පෙ. තුළ ප්‍රමුඛ වී ඇත්නම්, ජ.වි.පෙ. වැනි සංවිධානයක් සමජාතීය සංසයක් ලෙස පවත්වාගෙන යාම අසීරුය. කොයි හැටි වෙතත් ප්‍රධාන පක්ෂ

දෙකේ තරම් ජ.වි.පෙ. තුළ කුළ සාධකය ක්‍රියාත්මක වන්නේ යැයි කියා සිතීම අපහසුය. එය වරින් වර පුපුරා යන්නේ හෙළ උරුමය මෙන් කුළ ගැටුම් නිසා නොව විප්ලවීය සිහිනය දැකීමට තෝරා ගන්නා උපාය - උපක්‍රම නිසාය. නැතහොත් සටනේ ප්‍රතිඵල නරක් වූ විටය. එය සොයන්නේ හෙළ උරුමයේ සෝපාකලා මෙන් තමන්ටත් කිසියම් කුඩා අනන්‍යතාවයක් නොවේ. මුලු සමාජයේම නායකත්වයයි. රටේම බලයයි. කෙක්කෙන් බැරිනම් කොකකෙන් හරි ජය ගන්නට බලන්නේ එයයි. එල්.ටී.ටී.ඊ ය සමග එය සංසන්දනය නො කළ හැක්කේත් එබඳු බරපතල වෙනස්කම් නිසාය. එය පරාරෝපිත සංඝයක් වීම නිසාම එය සමග කිසිවෙකුටත් සම සම්මුති ගොඩනගාගත නොහැකිය. සම්මුතියක් එහි දශක 4 ක ඉතිහාසය ඊට සාක්ෂි දරයි.

ගැමි දුගීභාවය තුරන් කිරීමේ ව්‍යාපෘති මගින් හෝ ජන සමූහ සමාන්තර සමානත්වය ඇති කිරීම තුලින් කුළ බේද පිටු දැකීමේ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපෘති මගින් හෝ ජ.වි.පෙ. වැනි කැරලිකාර ව්‍යාපාර අහෝසිවන්නේ නැත. ඒවා අතුරුදන්වන්නේ ඒවායේ සිහිනය දැකීමට ඒවාටම ඉඩහැරීමෙනි. නැත්නම් නූලෙන් මිස්වුනා කිය කියා යලි යලිත් දේශපාලන රේස් ඔට්ටු ඇල්ලීම නවත්වන්නේ නැත. ලෝක සමාජවාදයේ බිඳවැටීම නිසාම නොව, වටින් ගොඩින් හෙලිදරව් වීම නිසාම, පසු ගිය කාලය තුළ, ජ.වි.පෙ.ට සිහින දකින්නට තව වැඩි වේලාවක් ඉතිරි වී තිබුනේ නැත. විමල් වීරවංශ හා සෝමවංශ ගැටුමෙන් එම කාලය තව තවත් කෙටි වී ඇති සැටියක් පෙනේ. ජලයෙන් උපන් ලුණු විනාශවන්නේ ජලයෙන්මය. ජ.විපෙ සිහිනය අවසන් කරන්නේ ජ.වි.පෙ. විසින්ම ය. දැන් සිදුවෙමින් තිබෙන්නේ එයයි. ජ.වි.පෙ. ගැන ඒ අවබෝධය ජන සමාජයට පළමුවද ජ.වි.පෙ.ට දෙවනුවද ලැබෙනු ඇත. පළමුව ජන සමාජය නින්දෙන් අවදි වී ඊළගට ජ.වි.පෙ. ද අවදිකරවනු ඇත. එ හෙත් කිවිඳු ගුණදාස අමරසේකර මහතා අවදිවේදැයි සිතා ගත නො හැකිය. මන්ද ඔහු නින්දේ නොමැති නිසාය.

අයිවන් මහතා සහ තවත් විද්වතුන් විසින් පෙන්වනු ලබන කුල යථාර්ථය දක්නට ලැබෙන්නේ ජාතික හෙළ උරුමය වැනි වර්ගවාදී සංවිධාන ඇසුරින්ය. ඔවුන්ගේ දේශපාලන බැනරයෙන් ඔතා ඇත්තේ ඔවුන් ගේම කුල දුකය. සිංහළ ජාතියේ වීරයන් වීම ඔවුන්ට අවශ්‍ය වී ඇත්තේ සමාජය ඔවුන් දෙස කුළ දෘෂ්ටියෙන් කරන බැලීම ගැරහුම මගහැරවීමට ය. සිංහළ ජාතියේ ඒ කුල පීඩක අශිෂ්ටකමට එරෙහිව නැගී සිටීමට ඔවුන්ට ශක්තියක් නැති නිසාය.

කුලය නමති දකුණු ආසියාතික උභතෝකෝටිකය කිසි විටෙකත් පීඩිතයාට ඉඩක් තබා නොතිබීම මේ බේදවාචකයට හේතුව බව මාගේ විශ්වාසයයි. ලංකාවේ අත්දැකීම් අනුව බලන කල වඩාත් සිංහල අන්තවාදය නියෝජනය කරන්නේ සගවාගත් යම් සමාජ පීඩනයකින් පෙළෙනවුන්ය. නැතහොත් පොදුජන සමාජයේ සාධාරණ පිළිගැනීමක් නැති අයය. ශ්‍රී ලංකාවේ උග්‍ර දේශප්‍රේමී ව්‍යාපාරවල සුලමුල එබඳුය. තමන් කෙරෙහි ඇති සමාජ අවසැලකිල්ල මග හරවා ගැනීමට ජාති හිතෛශීවීම සුදුසුයැයි ඔවුහු සිතති. අවසාන අරමුණ පොදුජන සමාජය අතර වටිනාකමක් ලබාගැනීමයි. ජාතිවාදියා යම් ආකාරයක මානසික ආතතියකින් පෙළෙන්නේයැයි කියා මිනිස් මනස ගැන දන්නා විද්වතුන් කියන්නේ මේ නිසාය.

--ප්‍රගීත් එක්නැලිගොඩ විසිනි---